මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

2019.05.21

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

By Fax

සියලුම පළාත් ආණ්ඩුකාරවරුන්

සියලු පළාත් මහා ලේකම්වරුන්

සියලු පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශ ලේකම්වරු

සියලු දිස්ත්‍රික් ලේකම්වරු

කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් මත පදනම්ව ඔවුන්ගේ ප්‍රවේශ වීමේ අයිතිය අහිමි කිරීම

පසුගිය සති දෙක ඇතුලත පොදු ස්ථාන වලට හා පොදු ගොඩනැගිලි තුලට ප්‍රවේශ වීම වලක්වන බවට නොයෙකුත් කාන්තාවන් විසින් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත.මෙවන් පැමිණිලි පිළිබඳව කොමිෂන් සභාව අතිශයින් සැලකිලිමත් වන අතර නීතියට පටහැනිව ක්‍රියාකරන අවස්ථාවක හැරුණු කොට පොදු ස්ථානයකට ප්‍රවේශ වීමේ හැකියාව කිසිම පුද්ගලයකුට අහිමි කල නොහැකි බැව් අප ඔබගේ අවධානයට ලක් කර සිටිමු.

හදිසි රෙගුලාසිවලට සහ සාමාන්‍ය නීතියට පටහැනිව කටයුතු නොකරන පුද්ගලයන් හට පොදු ස්ථාන වලට හා පොදු ගොඩනැගිලි තුලට ප්‍රවේශ වීමේ අයිතිය වැලැක්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන සහ 14 (1) (ඌ) වන වගන්ති යටතේ ඔවුන්ගේ සමානාත්මතාවයේ අයිතිය සහ ශ්‍රී ලංකාව තුල යාමේ ඒමේ අයිතිය උල්ලංඝනය කිරීමට හේතු සාධක වන බව ඔබගේ අවාධනයට ලක් කිරීමට කැමැත්තෙමු. මෙසේ ප්‍රවේශ වීම වැලැක්වීමෙන් යම් අවස්ථාවලදී එම කාන්තාවන්ට අත්‍යවශ්‍ය සේවාවන් ලබාගැනීමට පවා නොහැකිවී ඇති බව මෙම කොමිෂන් සභාවේ අවධානයට යොමු කොට ඇත.

ඔබ දන්නා පරිදි හදිසි නීති 32A ප්‍රකාරව පොදු ස්ථාන වලදී සම්පූර්ණ මුහුණම ආවරණය වන ආකාරයේ සියලු පැළඳීම් තහනම් කර ඇත. මෙම රෙගුලාසියෙහි අරමුණ වන්නේ යම් කිසි පුද්ගලයකුගේ අනන්‍යතාවය කිසිදු බාධාවකින් තොරව තහවුරු කර ගැනීමට අවකාශය සලසා දීම වේ.

මෙම තහනම් කිරීමට පටහැනි නොවන ආකාරයේ ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි කාන්තාවන්ද යම් ආයතන තුලට ප්‍රවේශ වීම වැලක්වූ බවට ලැබුණු පැමිණිලි කොමිෂන් සභාවේ අවධානයට ලක් වී ඇත. මෙසේ ප්‍රවේශය අවහිර කරන ලද කාන්තාවන් අතරට හිස් ආවරණ, හිස සහ නිකට වටා යන එක් පසෙකින් හෝ හිස පසු පසින් කටුවකින් රඳවා තබන ආවරණ පැළඳ සිටි කාන්තාවන්ද ඇතුලත් වේ. යම් අවස්ථාවන්හිදී තමන් හිසෙහි එක් පසකට රඳවන කටුව ඉවත් කිරීමට මෙම කාන්තාවන්ට සිදු වී ඇති අතර, එය ඔවුන්ගේ මුළු හිස් ආවරණයම කඩා හැලීමට හේතු වී ඇත. ඒ සෑම අවස්ථාවකදීම මෙම කාන්තාවන් සම්පූර්ණ මුහුණ ආවරණය කර සිට නැත.

එමෙන්ම ආයතන වලට පිවිසෙන දොරටුව අසල සේවය කරන නිලධාරීන් විසින් ප්‍රවේශ වීමට අදාළ කටයුතු යම් අවස්ථාවලදී තම අභිමතය පරිදි සිදුකරන බව අප නිරීක්ෂණය කර ඇත්තෙමු. ඔවුන් මුහුණ ආවරණය කර



ප්‍රධාන කාර්යාලය
தலைமைக் காரியாலயம்
14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04.
14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail sechrcsl@gmail.com

නොමැති, එහෙත් සම්පූර්ණ සිරුර ආවරණය වන සේ (අබායා) සැරසී සිටින කාන්තාවන්ට ආයතන තුලට ප්‍රවේශ වීම වළකා ඇති බව පෙනී යයි.

සමහර අවස්ථාවලදී ඔබගේ බලතල වලට යටත්වන ආයතන තුලට ප්‍රවේශ වීමට තහනම්වූ සමහර කාන්තාවන්ට මෙහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය ලියවිලි ලබාගත නොහැකි වීමෙන් කාලීන ලෙස රැකියා හා අනෙකුත් සේවාවන් සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව අපට වාර්තා වී ඇත.

මෙසේ ප්‍රවේශය වළකා සිටීම සහ ඒ හේතුකොටගෙන තමන්ට අවශ්‍ය සේවාවන් (යම් අවස්ථාවලදී අත්‍යවශ්‍ය සේවාවන්) නොලැබී යාම දැඩි මානසික වේදනාවට සහ එමගින් හුදෙකලාවූ හැඟීමකට හේතු වී ඇත. එමෙන්ම, මෙම කොමිෂන් සභාවට ලැබුන පැමිණිලි වලට අනුව, මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලය ලෙස, විවෘතව පොදු ජන ජීවිතයට ඉතාමත් සුහදව සහභාගී වෙමින් සිටි කාන්තාවන් තම නිවාස වලට කොටුවී ඇති බව අපට සනාථ වී ඇත. අපගේ රට ඉතා සංවේදී මොහොතකට මුහුණ පා සිටින මේ අවස්ථාවේ, මිනිසුන් අතර වෙනස්කම් මතුවන ආකාරයෙන් කටයුතු නොකොට, ඔවුන් අතර සාමය සහ සංහිඳියාව ඇතිවන ආකාරයෙන් කටයුතු කිරීම සඳහා අප සියල්ලන් සතුවම වගකීමක් ඇති බව අප සිහිපත් කරමු.

එසේ හෙයින්, හදිසි රෙගුලාසි කඩ නොවන ආකාරයේ ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටින පුද්ගලයන්ට ඔබගේ බලතල තුලට වැටෙන ආයතන/ස්ථාන වලට ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කරන ලෙසට  අප ඔබගෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම, ප්‍රවේශ වීමේ අයිතිය වලක්වා සිටින පුද්ගලයන්ට එරෙහිව විනයානුකූල පියවර ගත යුතු බවද අප ඔබගෙන් ඉල්ලා සිටිමු. මීට අමතරව, මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, හදිසි රෙගුලාසි යටතේ තහනම් කර නොමැති ආකාරයේ ඇඳුම් පැළඳුම් මොනවාද යන්න පිළිබඳව ඔබ යටතේ තිබෙන සියලුම ආයතන දැනුවත් කරන ලෙසද අප ඉල්ලා සිටිමු.

ඔබ යටතේ ඇති ආයතන වල පැහැදිලිව ප්‍රදර්ශනය කිරීම සඳහා  හදිසි රෙගුලාසි වලට අනුකූල වන හා අනුකූල නොවන හිස් ආවරණ වල රූපමය විස්තරයක් මේ සමඟ අමුණා එවා ඇත.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපතිනී
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## Head covering worn by Muslim women



| Burqa | Niqab | Chador | Hijab |
|---|---|---|---|
| Covers the head and the body and has a grill which hides the eyes. | A veil that entirely covers a person, including the mouth and the nose. It has a small opening for the eyes. | Full body cloak revealing eyes or face. | A Hijab is a headscarf not a veil. Hides the hair, ears, and neck. Only the oval shape of the face is visible. |

©DM GraphicDesk




| Banned | Not banned |
|---|---|
| Burqa | Chadors |
| Niqab | Hijabs |
| Fullface | Half |
| Modular | Openface |
| Off-road | Dual-Sport |